(අන්තර්ජාල අනුවාදයකි.)

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 25 දරන
## මුද්දර ගාස්තු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1999 අගෝස්තු මස 30 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 සැප්තැම්බර් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිළ : රු. 3.50** **තැපැල් ගාස්තුව : රු. 3.50**

## 1999 අංක 25 දරන මුද්දර ගාස්තු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1999 අගෝස්තු මස 30 වැනි දින]

එල්. ඩී.– ඕ. 66/98.

### 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 1999 අංක 25 දරන මුද්දර ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. 1996 අංක 38 දරන පනතින් අවසන් වරට සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— 1982 අංක 43 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (24) වන ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

> "(24) ණය සුරැකුම්පතක් හෝ ණය සුරැකුම්පතක් විකිණීමට හෝ පැවරීම සඳහා ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක් ;" සහ

(2) ඒ වගන්තිය අගට පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

> "(27) භාණ්ඩාගාර බිල්පත්වලට හෝ ආණ්ඩුවේ සුරැකුම්පත්වලට අදාළව යම් ප්‍රාථමික අලෙවිකරුවකු සමග ඇති කර ගන්නා ලද නැවත මිළට ගැනීමේ ගිවිසුමක්.".

**3**. 1996 අංක 06 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියේ "ඇටෝර්නි බලය" යන යෙදුමේ අර්ථ කථනයට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම.

> "ප්‍රාථමික අලෙවිකරු" යන්නෙන් භාණ්ඩාගාර බිල්පත් හෝ ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ගණුදෙනු කිරීමේ කාර්යය සඳහා ප්‍රාථමික අලෙවිකරුවකු වශයෙන් දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ

හෝ ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පත්කරන ලද යම් වාණිජ බැංකුවක්, සමාගමක් හෝ වෙනත් තැනැත්තෙක් අදහස් වේ ;".

අතීතයට බලපෑම.

**4**. පිළිවෙලින් මේ පනතේ 2 වන වගන්තිය සහ 3 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට සහ 71 වන වගන්තියට කරන ලද සංශෝධන, 1998 නොවැම්බර් මස 6 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.